# ගුණවතාගේ නුගුණ කියන්නා නිරයට පැමිණේ
## වණ්ණ සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 2 - පිටු අංක 158 - 161)

කරුණු සතරකින් යුතු පුද්ගලයා ගෙනවිත් තැබූ සේ නිරයේ පිහිටයි.

කවර කරුණු සතරකින් ද යත්;

- නොවිමසා මනා ව අවබෝධ නොකොට අගුණවත් තැනැත්තාගේ ගුණ කියයි.
- නොවිමසා මනා ව අවබෝධ නොකොට ගුණවත් තැනැත්තාගේ නුගුණ කියයි.
- නොවිමසා මනා ව අවබෝධ නොකොට නොපැහැදිය යුතු තැන පහදියි.
- නො විමසා මනා ව අවබෝධ නොකොට පැහැදිය යුතු තැන නොපහදියි.

මේ කරුණු සතරින් යුතු පුද්ගලයා ගෙනවිත් තැබූ සේ නිරයේ පිහිටයි.